# වාර්ෂික වාර්තාව - 2015
# ஆண்டறிக்கை - 2015
# Annual Report - 2015


## හෝමියෝපති වෛද්‍ය සභාව
ஹோமியோபதி மருத்துவ சபை

Homoeopathic Medical Council

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර.
දුරකථන අංක : 011-2958175 ෆැක්ස්: 011-2958175
e mail : homosri.mcouncil@gmail.com



**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**
சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
Ministry of Health, Nutrition & Indigenous Medicine

Homoeopathic Medical Council

Samuel Hahnemann

Sri Lanka

# වාර්ෂික වාර්තාව

# 2015

# හෝමියෝපති වෛද්‍ය සභාව

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | සාරාංශය | 01 |
| 2. | හැඳින්වීම | 02 |
| 3. | හෝමියෝපති වෛද්‍ය සභාව | 03 |
| 4. | පසුබිම් විස්තරය | 04 |
| 5. | වෛද්‍ය සභාවේ අරමුණු | 07 |
| 6. | වෛද්‍ය සභාව සතු බලතල | 08 |
| 7. | වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 09 |
| 8. | සංස්ථාපිත තොරතුරු | 10 |
| 9. | වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2015 | 11 |
| 10. | හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 13 |
| 11. | විගණන වාර්තාව | 22 |
| 12. | සුභාසිංශන | 23 |

# 01. සාරාංශය

2015 වසරේ හෝමියෝපති වෛද්‍ය සභාව ක්‍රියාත්මක කළ සංයුක්ත ක්‍රියාමාර්ග සහ ඒවායේ ප්‍රතිඵලයන් ඇතුළත් 2015 වාර්ෂික වාර්තාව මෙසේ එළි දැක්වේ.

වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම මඟින් බලාපොරොත්තු වන හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු, සැලසුම්, උපාය මාර්ග හා වසර තුළ අනුගමනය කළ ක්‍රියා මාර්ග පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු ඇමතිතුමා හා ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සමස්ත විධායකයේත්, ව්‍යවස්ථාදායකයේත්, මඟපෙන්වීමක් ලබා ගැනීම, 2015 වාර්ෂික වාර්තාවේද අරමුණ වේ.

2015 වසර අවසානය වන තෙක්ද හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීමට හැකි වූයේ නැත. මෙම වසරේද එහි කටයුතු මෙහෙයවනු ලැබුවේ හෝමියෝපති අතුරු පාලක කමිටුව විසිනි. අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පත් කරනු ලැබූ හෝමියෝපති වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් හෝමියෝපති තාක්ෂණික කමිටුවක සහාය මෙම කමිටුවට ලැබුණි.

පැහැදිලි දැක්මක් සහිත කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතු ස්ථාවර හෝමියෝපති වෛද්‍ය සභාවක් ස්ථාපිත කර ගැනීමේ අරමුණින් එක් අතකින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නව පනතක් ගෙන ඒම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග වෙත යොමු වී සිටි අතර, හෝමියෝපති අතුරු පාලක කමිටුව හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අයත් කාර්යයන් නියාමනයට හා මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස හෝමියෝපති ක්‍රමය පවත්වා ගෙන යාමට අමතරව හෝමියෝපති වෛද්‍ය ආයතනික ව්‍යුහය ස්ථාවර පදනමකින් ගොඩනැගීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම කෙරෙහි මෙම වසර තුළදී මූලික වශයෙන් යොමු විය. ඒ අනුව හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙය වනු ලබන සායන 07 හි කාර්ය මණ්ඩලයේ මෙතෙක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබූ වෛද්‍ය තනතුරු සඳහා ස්ථිර වෛද්‍යවරුන් බඳවා ගනු ලැබූ අතර ඖෂධ සංයෝජකයන් ස්ථිර තනතුරු වල පිහිටුවන ලදී. වසර ගණනාවක් පුරා පැවති වෛද්‍යවරුන්ගේ ප්‍රබල ඉල්ලීමක් වූ රෝගීන්ට බෙහෙත් නිකුත් කිරීම සඳහා යොදා ගන්නා ප්ලාස්ටික් බහාලුම් සහ කවර රජයේ හෝමියෝපති සායන වෙත ලබා දීම සඳහා මිලදී ගන්නා ලදී. කුරුවිට (පරකඩුව) හා මොණරාගල සායන ඉඩකඩ සහිත ගොඩනැඟිලි වෙත ගෙන යාමට හැකි වූ අතර පාලමුණෙ සායනය අඬ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රතිසංස්කරණය කර ගැනීමට හැකි විය.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවයක් දක්වා නඟාසිටුවීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා වන වෛද්‍ය සභාවේ අරමුණත්, මෙම වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම පිණිස උපාය උපක්‍රමයන් හඳුන්වාදීමේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අරමුණුත් සාධනයෙහි ලා ගත් උත්සාහයන්ද මෙම වාර්තාව මඟින් එළි දක්වා ඇත.

# 02. හැඳින්වීම

“සමාන දෙයින් සමාන දෙය නැසීම” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැක. 18 වන ශත වර්ෂයේ ජර්මන් ජාතික විද්‍යාඥයකු වූ ක්‍රිස්ටියන් ෆෙඩ්‍රික් සැමුවෙල් හානිමාන් යන වෛද්‍යවරයා මෙම වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ මෙන්ම, වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීමටද මහඟු සේවයක් කළ තැනැත්තෙකි. අද දින හෝමියෝපති ක්‍රමය පිළිගත් වෛද්‍ය ක්‍රමයක් ලෙස ලෝකයේ බොහෝ රටවල භාවිත කරයි. උදාහරණයක් ලෙස ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රට පුරා විහිදුනු හෝමියෝපති සායන හා රෝහල් මඟින් හෝමියෝපති ප්‍රතිකාර මහජනතාවට ලබාදේ.

1970 අංක 07 දරණ පනතේ 1 වන කොටසේ, 2 වන වගන්තියේ, 1 වන උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කර ඇත.

ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතුරින් තෝරා පත් කර ගනු ලබන හත් දෙනෙකුගෙන් හෝමියෝපති වෛද්‍ය සභාව සමන්විත වේ. ( මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව විසුරුවා හැර ඇති අතර එහි කටයුතු අතුරු පාලක කමිටුවක් මඟින් පාලනය වේ.) සභාවේ ලේඛකාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේකම්වරයා වේ.

මෙම සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 07 ක් දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුණේ, මාතලේ කුරුණෑගල හා තෝලංගමුව යන ස්ථාන වල පිහිටුවා ඇත.

# 03. හෝමියෝපති වෛද්‍ය සභාව

## දැක්ම

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම”

## මෙහෙවර

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරහයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නඟා සිටුවීම හා අභිවර්ධනය කිරීම.”

## පරමාර්ථ

1970 අංක 07 දරණ හෝමියෝපති පනතේ විධි විධාන වලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

# 04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ප්‍රධාන වශයෙන්ම වෘත්තීමය මණ්ඩලයකි. ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් හෝමියෝපති පනත ප්‍රකාරව විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් පත් කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් සඳහා සාමාජිකයන් ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතර පවත්වන ඡන්දයක් මඟින් තෝරා පත්කර ගනු ලැබේ. ගරු විෂය භාර ඇමතිතුමාගේ නිර්දේශයන් හා ඇමතිතුමා ප්‍රකාශයට පත්කරන නියෝග වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය සභාවේ රාජකාරි හා බලතල ක්‍රියාත්මක කළ යුතුය. හෝමියෝපති පනතට අනුව රෙගුලාසි සම්පාදනය කිරීමට හෝමියෝපති වෛද්‍ය සභාවට බලතල ඇත. එම රෙගුලාසි හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කළ යුතුය.

### නීති සහ රෙගුලාසි

හෝමියෝපති ක්‍රමය රජය පිළිගත් වෛද්‍ය ක්‍රමයක්ව වසර 47 ක පමණ කාලයක්ද, හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර වසර 38 ක පමණ වැඩි කාලයක්ද ගතව ඇතත් අවාසනාවකට මෙන් හෝමියෝපති පනත බලාත්මක වීමට මෙතෙක් සම්පාදනය කර ඇත්තේ අවශ්‍ය රෙගුලාසි වලින් සුළු ප්‍රමාණයක් පමණි. මෙම තත්ත්වය හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ දියුණුවට බාධාවක් මෙන්ම පනත අභිබවා යමින් නොයෙක් වංචා සිදු කිරීමටද පිටිවහලක්ව ඇත. තවද මේ නිසා වෛද්‍ය සභාවට තම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට නොහැකිවී ඇති අතර, නිසි ලෙස බලාත්මක වීමටද නොහැකිවී ඇත.

## මෙතෙක් ප්‍රකාශයට පත් කළ අනු නීති

1. හෝමියෝපති රෙගුලාසි - 1980
2. වෛද්‍ය සභාවේ නීති - 1981

   (වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)
3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

පළමු හෝමියෝපති වෛද්‍ය සභාව 1979 වසරේදී ස්ථාපිත කර ඇත. ගරු අමාත්‍යතුමා විසින් පනතේ නියෝග වලට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවට සාමාජිකයින් පත්කරමින් හෝමියෝපති පනත බලාත්මක කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන්හි සාමාජිකයින් හෝමියෝපති පනතේ රෙගුලාසි වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයක් පවත්වා තෝරා පත් කර ගෙන ඇත. තෙවන හෝමියෝපති වෛද්‍ය සභාව පනතේ නියෝග වලට අනුකූලව වෛද්‍ය සභාවේ සාමාජිකයන් ධූර වලින් පහ කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන්

- ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් ගරු ඇමතිතුමා විසින් පනතේ නියෝග වලට අනුකූලව පත්කරන ලදී. (1979-1989)
- ඉන් පසු වසර 10 ක් පමණ වෛද්‍ය සභා නිලවරණ රෙගුලාසි සම්පාදනය නොකිරීම නිසා වෛද්‍ය සභාව අකර්මණ්‍යව පැවතිණ. (1989-1998)

- නිලවරණයක් පවත්වා වසර 5 ක කාල සීමාවකට 1998 සැප්තැම්බර් මස වෛද්‍ය සභාව තෝරා පත් කර ගන්නා ලදී. (1998-2003)

- නැවත වසර 03 ක පමණ කාලයක් විෂය භාර අමාත්‍යාංශය මාරුවීම සහ නොයෙකුත් නීතිමය කරුණු නිසා වෛද්‍ය සභාව අකර්මණ්‍යව පැවතින. (2003 -2006 )

- තෙවන වෛද්‍ය සභාව 2006 වසරේදී නිලවරණයක් මඟින් තෝරා පත් කර ගත් අතර එය 2009 ජූලි මාසය දක්වා පැවතිණ. ගරු අමාත්‍යතුමා 2009 ඔක්තෝබර් මස වෛද්‍ය සභා සාමාජිකයින් ධූර වලින් ඉවත් කර එම තනතුරු සඳහා නව සාමාජිකයින් පත් කරන ලදී.

- ගරු අමාත්‍යතුමා විසින් 2009.10.29 දිනැති අංක 1625 දරණ විශේෂ ගැසට් නිවේදනයක් අනුව විසුරුවා හරින ලද වෛද්‍ය සභාවේ ඉතිරි වසර දෙක සඳහා වෛද්‍ය සභාවක් පත් කරන ලදී. එම වෛද්‍ය සභාවේ කාලය නිමවීමත් සමඟ 2011 ජනවාරි 31 වන දින එම වෛද්‍ය සභාව අහෝසි විය.

- එතැන් පටන් 2011 ජූනි 16 දින දක්වා වෛද්‍ය සභාවක් නොපැවතුණි.

- ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා ගරු නීතිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු විෂය භාර ඇමතිතුමා විසින් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා 2011 ජූනි 16 හෝමියෝපති අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී. එතැන් පටන් 2015 දෙසැම්බර් 31 දක්වා වෛද්‍ය සභාවට අයත් කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ අතුරු පාලක කමිටුව මඟිනි.

# 05. වෛද්‍ය සභාවේ අරමුණු

**හෝමියෝපති වෛද්‍ය සභාවේ අභිමතාර්ථ පහත සඳහන් පරිදිය.**

1. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචිය කිරීම.

2. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ නියමයන් හා වෘත්තීමය ආචාර ධර්ම සුරක්ෂිත කිරීම.

3. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීම සහ ධෛර්යමත් කිරීම මෙන්ම හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම.

4. හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හා ආයතන ස්ථාපිත කිරීම සහ නෛතිකව පිළිගැනීම.

5. හෝමියෝපති ඖෂධ හා විලවුන් නිෂ්පාදනය , ආනයනය , වෙළදාම , පාලනය සහ නියාමනය.

6. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හා මහජන සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමට පොත්පත් , සඟරා ප්‍රකාශයට පත් කිරීම.

7. හෝමියෝපති පනතට අනුකූලව නීති සහ ආචාරධර්ම ප්‍රකාශයට පත් කිරීම.

8. හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව වෘත්තීමය මණ්ඩලයක් වශයෙන් හෝමියෝපති වෘත්තිකයන්ගේ හා සාමාජික වගකීම් පිළිබඳව ගරු අමාත්‍යතුමා දැනුවත් කිරීම.

# 06. වෛද්‍ය සභාව සතු බලතල

**හෝමියෝපති පනතේ 23 වන නියෝග පරිදි වෛද්‍ය සභාව සතු බලතල පහත සඳහන් පරිදි වේ.**

1. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.
2. අවස්ථානුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාල අනුමත කර පිළිගැනීම.
3. පිළිගත් වෛද්‍ය විද්‍යායතන සඳහා වූ පාඨමාලා විෂය නිර්දේශ හා සංස්කරණ පාඨමාලා සඳහා වූ විෂය නිර්දේශ නියම කිරීම.
4. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි අධ්‍යාපනය ලබන සිසුන්ට විභාග පවත්වා උපාධි හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
5. විභාග ගාස්තු හා ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් මුදල් නියම කර සිටීම සහ අයකර ගැනීම.
6. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි තත්ත්වය හා ගුණාත්මක වර්ධනය පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම හා අධ්‍යාපන තත්ත්වයන් පිළිබඳ තහවුරු කිරීම.
7. වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විභාග පැවැත්වීමට සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් මෙන්ම බාහිර පරීක්ෂකවරුන්ද පත්කිරීම.
8. පනතේ විධිවිධාන හා අපේක්ෂිත නිර්දේශ හා නිර්ණායකයන් අනුව කටයුතු නොකරන වෛද්‍ය විද්‍යායතන සම්බන්ධව කටයුතු කිරීම
9. හෝමියෝපති පර්යේෂණ ආයතන පිහිටුවීම, පශ්චාත් උපාධි පාඨමාලා සංවිධානය කිරීම, හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය සඳහා පියවර ගැනීම.
10. හෝමියෝපති සඟරාවන් ප්‍රකාශයට පත් කිරීම.
11. පනතේ අරමුණු ඉටු කිරීම සඳහා හෝමියෝපති අරමුදල යොදවා ගැනීම.
12. පනතේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ අභිවෘද්ධිය සඳහා කාර්යයන් හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම, සහ ක්‍රියාත්මක කිරීම.
13. වෛද්‍ය සභාවේ කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට හා පනතේ විධිවිධාන බලාත්මක කිරීමට රෙගුලාසි සම්පාදනය කර ගරු අමාත්‍යතුමා විසින් අවශ්‍ය රෙගුලාසි පාර්ලිමේන්තුවෙන් අනුමත කරවා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීම.

# 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය

හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සභාපතිද ඇතුළුව හෝමියෝපති වෛද්‍යවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ ඡන්දයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයින් තෝරා පත් කර ගනු ලැබේ. වෛද්‍ය සභාවේ ලේකම් / ලේඛකාධිකාරී පත්කරනු ලබන්නේ වෛද්‍ය සභාව විසිනි. වෛද්‍ය සභාවට තේරී පත් වූ සාමාජික / සාමාජිකාවන් අතරින් වෛද්‍ය සභාවේ සභාපති ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාව නීත්‍යානුකූලව බලාත්මක වනුයේ එය ගරු අමාත්‍යතුමා විසින් ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුවය. වෛද්‍ය සභාව තෝරා පත් කර ගනු ලබන්නේ වසර 05 ක  කාලයක් සඳහාය.

# 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **ආයතනයේ නම** | :- | හෝමියෝපති වෛද්‍ය සභාව. |
| **ලිපිනය** | :- | අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම. |
| **දුරකථන අංකය** | :- | 011-2958175 |
| **ෆැක්ස්** | :- | 011-2958175 |
| **විද්‍යුත් තැපැල** | :- | homosri.mcouncil@gmail. Com |
| **සංස්ථාපිත ආයතනයේ තත්ත්වය** | :- | 1970 අංක 07 දරණ හෝමියෝපති පනතේ 22 හා 23 වගන්ති ප්‍රකාර බලතල සහ පරමාර්ථ සහිතව හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත. |
| **පරිපාලන ව්‍යුහය** | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| **බැංකුකරුවෝ** | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල ශාඛාව |

# 09. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2015

## අරමුණ 01

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම.

## උපාය මාර්ග

- ප්‍රතිකාර ලබා දීම තුළින් මහජන විශ්වාසය ගොඩනැගීම.
- වැඩිහිටියන් සහ ළමුන් තුළ වෛද්‍ය ක්‍රමය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම.
- අමාත්‍යාංශයේ සහ සියළුම ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
- හෝමියෝපති වෛද්‍යවරුන් අතර සුහදත්වය වර්ධනය කිරීම.

## අරමුණ 02

හෝමියෝපති සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම.

## උපාය මාර්ග

- හෝමියෝපති වෛද්‍ය සභාවේ පරිපාලන ප්‍රතිපත්තිය පිළිබඳ රෙගුලාසි සම්පාදනය කිරීම.

## අරමුණ 03

හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම.

### උපාය මාර්ග

- බඳවා ගැනීමේ ව්‍යුහයේ වෙනස්කම් අනුමත කර ගැනීම.
- වැටුප් සහ සේවක සංඛ්‍යාව.
- කොමිසමේ අනුමැතිය ලබා ගැනීම.

## අරමුණ 04

හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීම හා පරිපූරක වෛද්‍යවරුන් බිහි කිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

### උපාය මාර්ග

- අතුරු නීති සම්පාදනය , පිළිගැනීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිහිටුවීම.

## අරමුණ 05

හෝමියෝපති ඖෂධ හා නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ සුලභතාවය තහවුරු කිරීම.

### උපාය මාර්ග

- අතුරු නීති සම්පාදනය.
- හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම.

# 10. හෝමියෝපති වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වය 2015 ජනවාරි සිට දෙසැම්බර්

## 10 -1 සායන කළමනාකරණය සහ පවත්වාගෙන යාම

- වෛද්‍ය සභාව යටතේ දිස්ත්‍රික් 07 ක පිහිටුවා ඇති රජයේ හෝමියෝපති වෛද්‍ය සායන 07 ක් පවත්වාගෙන යාම.

- වෛද්‍ය සභාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන මෙම සායන වලට ස්ථිර වෛද්‍යවරුන් 07 දෙනෙකු බඳවා ගැනීම.

- කොන්ත්‍රාත් පදනමින් සේවය කල සායන 07 හි ඖෂධ සංයෝජකවරුන්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.

- රජයේ හෝමියෝපති සායන 07 වෙත ගෘහ උපකරණ සහ වෛද්‍ය උපකරණ ලබා දීම.

- ඖෂධ සංයෝජක NVQ පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය සමඟ පාඨමාලාව සැකසීම ආරම්භ කර තිබීම.

- කුරුවිට ප්‍රාදේශීය සභාවේ පහසුකම් සහිත ස්ථාවර ගොඩනැගිල්ලක් වෙත පරකඩුව රජයේ හෝමියෝපති සායනය ගෙන යාම.

- මොණරාගල සායනය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත රජයේ ගොඩනැගිල්ලක් ලබා ගැනීම.

- අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව මඟින් පාලමුණෙයි සායනයේ සායන ගොඩනැගිල්ලට අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් සිදු කිරීම.

- දෙහිවල සායනය පහසුකම් සහිත මහජන සෞඛ්‍ය ගොඩනැඟිල්ල වෙත ගෙන යාම.

- වසර ගණනාවක් තිස්සේ වෛද්‍යවරුන්ගේ ප්‍රබල ඉල්ලීමක් වූ රෝගීන්ට බෙහෙත් නිකුත් කිරීම සඳහා යොදා ගන්නා ප්ලාස්ටික් බහාලුම් සහ කවර සායන වෙත ලබා දීම සඳහා මිලදී ගැනීම.

**සායන වල කාර්ය සාධනය**

වෛද්‍ය සභාව අධීක්ෂණය කරනු ලබන පහත සඳහන් සායන 7 තුළින් රෝගීන් 58,685 ක් වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගෙන ඇත.

| | සායනය | රෝගීන් ගණන |
|---|---|---|
| 01 | දෙහිවල | 12,869 |
| 02 | මොණරාගල | 3,174 |
| 03 | පාලමුනෙයි | 12,867 |
| 04 | මාතලේ | 7,050 |
| 05 | කුරුණෑගල | 10,130 |
| 06 | පරකඩුව | 7,409 |
| 07 | තෝලංගමුව | 5,186 |
| | එකතුව | 58,685 |

වර්ෂ අවසානය වන විට ඉහත සඳහන් සෑම සායනයකම රෝගී සහභාගීත්වය ඉහළ ගොස් තිබුණි. දෙසැම්බර් මාසයේ පමණක් සායන 07 හි රෝගී සහභාගීත්වයේ එකතුව 5225 ක් වූ අතර සායන 07 න් දිනකට ප්‍රතිකාර ලබා ගන්නා රෝගී සංඛ්‍යාවේ සාමාන්‍ය 169 ක් දක්වා වර්ධනය වී තිබුණ

## 10 -2. අතුරු පාලක කමිටුව

2015 ජනවාරි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි සාමාජික සාමාජිකාවන් 5 දෙනෙකුගෙන් යුත් අතුරු පාලක කමිටුවක් ගරු ඇමතිතුමා විසින් 2015.01.01 දින පත් කරන ලදී. එහෙත් මෙම කමිටුව ක්‍රියාත්මක වූයේ නැත.

2015.03.25 වන දින සිට ඉදිරි මාස 06 ක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් නව අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී.

01. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විජිතා සෙනෙවිරත්න මිය (දේශීය වෛද්‍ය අංශය) - සභාපති

02. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ( මුදල්) ii එම්. ටී. ආර්. සී. චිත්‍රලතා මිය - සාමාජිකා

03. වැලිසර රජයේ හෝමියෝපති රෝහලේ හෝමියෝපති වෛද්‍ය ඒ. ජේ. එම්. මුනව්වර් මහතා මහතා - සාමාජික

මෙහි ධුර කාලය 2015.09.25 වන දින අවසන් විය.

2015.09.20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හෝමියෝපති නව පනත සම්මත වී පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය සභාව පත්වන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යාමේ අරමුණින් නව අතුරු පාලක කමිටුව සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලැබීය.

01. සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විජිතා සෙනෙවිරත්න මිය (දේශීය වෛද්‍ය අංශය) - සභාපති

02. සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරී (ප්‍රධාන) ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී මිය ( දේශීය වෛද්‍ය අංශය) - සාමාජිකා

03. වැලිසර රජයේ හෝමියෝපති රෝහලේ හෝමියෝපති වෛද්‍ය ඒ. ජේ. එම්. මුනව්වර් මහතා - සාමාජික

## අතුරු පාලක කමිටු රැස්වීම්

| දිනය | කමිටු වාරය |
|---|---|
| 1. 2015.04.02 | 30 |
| 2. 2015.05.28 | 31 |
| 3. 2015.06.30 | 32 |
| 4. 2015.08.06 | 33 |
| 5. 2015.09.17 | 34 |
| 6. 2015.10.29 | 35 |
| 7. 2015.12.02 | 36 |

## 10 -3 හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සහ නව බඳවා ගැනිම්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| 01. කළමනාකරණ සහකාර | 01 ( බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා ලදී.) |
| 02. ඖෂධ සංයෝජක | 07 (ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලදී) |

## 10 -4 බඳවා ගැනීමේ පරිපාටිය හා කාර්ය මණ්ඩල වෙනස්වීම්

❖ පුරප්පාඩු වී ඇති කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව පුවත්පත් වල දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවූ අතර නොවැම්බර් මස 19,20 හා 21 යන තෙදින තුළ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබා ගත් අයදුම්කරු බඳවා ගැනිමට හෝමියෝපති අතුරු පාලක කමිටුව තීරණය කරන ලදී.

- ❖ නව සායන 07 ක් සහ ජංගම සායන පැවැත්වීම සඳහා වෛද්‍ය වෘත්තිකයන් 08 ක් ද ඖෂධ සංයෝජකයින් 07 ක් ද පවත්නා සායන සහ නව සායන සඳහා කම්කරුවන් 14 ක්ද සඳහා තනතුරු අනුමත කරවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගෙන තිබුණි.

- ❖ 2015.06.01 දින සිට 2015.07.26 දින දක්වා පුහුණු ආධුනික නිලධාරිනියක ලෙස සේවයේ යොදවා ගැනීම සඳහා කටයුතු කරන ලදී.

- ❖ 25/2014 චක්‍ර ලේඛයට අනුව තාවකාලික, අනියම් (දෛනික, ආදේශක හෝ කොන්ත්‍රාත්) පදනමින් බඳවා ගෙන ඇති සහ 2014.10.24 දිනට දින 180 ක සතුටුදායක කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් 2014.10.24 දින සිට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ රජයේ තීරණයට අනුව, හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ පාලනය වන හෝමියෝපති සායන 07 හි තාවකාලික/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති හෝමියෝපති ඖෂධ සංයෝජකයින් 07 දෙනා වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කෙරුණි.

- ❖ හෝමියෝපති සායන සඳහා ඖෂධ සංයෝජකයින් බඳවා ගැනීමේ දී අනිවාර්ය සුදුසුකමක් ලෙස දක්වා ඇති NVQ iii මට්ටමේ සහතිකය නිකුත් කළ හැකි පාඨමාලාවක් ආරම්භ කිරීමට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ කටයුතු කරමින් සිටී.

## 10 -5 දත්ත හා කාලීන තොරතුරු

- 2015 දෙසැ. 31 දක්වා ලියාපදිංචි වී ඇති වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය

| කාණ්ඩය | උපාධිධාරී | ඩිප්ලෝමාධාරී | සාමාන්‍ය | ලියාපදිංචි වූ මුළු වෛද්‍යවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 27-1-a | 04 | 51 | | 55 |
| 27-1-b | 04 | | | 10 |
| 27-1-c | | | 83 | 83 |
| 27-2 | | | 49 | 49 |
| 27-5 | | | 70 | 70 |
| ලියාපදිංචිය තහවුරු කර ගත යුතු | | | | 02 |
| එකතුව | 08 | 51 | 202 | 269 |

සාරාංශය

| | ලියාපදිංචිය ලත් වෛද්‍යවරු | විධිමත් ලෙස ලියාපදිංචි නොවූ | 2015 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කළ | 2015 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන නොකළ | මිය ගිය ගණන |
|---|---|---|---|---|---|
| මුළු ගණන | 269 | 02 | 149 | 72 | 46 |

## 10 - 6 ඖෂධ ආනයනය සඳහා වෛද්‍ය වෘත්තිකයින් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

- 2015 ජනවාරි සිට දෙසැම්බර් 30 දක්වා ඖෂධ ආනයනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 11 කට අනුමැතිය ලබා දී ඇත.

- ඒවායෙහි මුළු වටිනාකම ඇ.ඩො. 23,350.03 කි.

## 10 -7 මාධ්‍ය මඟින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මහජනයා තුළ අවබෝධයක් ඇති කිරීම සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයට අයත් වෛද්‍යවරියන් දෙදෙනෙකුගේ සහභාගීත්වයෙන් සජීවී රූපවාහිනී වැඩසටහන් 15 ක් සහ ගුවන් විදුලි වැඩසටහන් 3 ක් පවත්වා ඇත.

මෙම වැඩ සටහන් වලින් පසුව රජයේ හෝමියෝපති සායන වල රෝගීන්ගේ සහභාගීත්වය 1/3 පමණ වර්ධනය විය.

## 10 -8 අධිකරණ කටයුතු

### ශ්‍රේෂ්ඨාධිකරණය

1. **FR / SC / 129/ 2014 නඩුව.**

   2014 ජනවාරි මාසයේදී හෝමියෝපති අතුරු පාලක කමිටුව මඟින් ලියාපදිංචිය ලබා දුන් වෛද්‍යවරු 47 දෙනෙකුගේ ලියාපදිංචිය අහෝසි කරන ලෙස ඉල්ලා පවරා තිබූ ඉහත අංක දරණ නඩුව 2015 දෙසැම්බර් මාසයේදි ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාගයට නොගෙනම ඉවත දමන ලදී.

**2. FR / SC / 385/ 2013 නඩුව.**

හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් සඳහා විභාගය පැවැත්වීමට අතුරු පාලක කමිටුවට ඉඩ නොදී හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්වන තෙක් කල් දමන ලෙස ඉල්ලා හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් තිදෙනෙකු පවරා තිබූ නඩුව වසර අවසාන වන තෙක්ම ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විභාගයට ගෙන නොතිබිණි.

**අභියාචනාධිකරණය**

**1. 87 / 2013 අංක දරණ නඩුව**

87/2013 අංක දරණ අභියාචනාධිකරණ නඩුව හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියා පදිංචි කිරීම නතර කරන ලෙස නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා පවරනු ලැබූ නඩුව වසර අවසානයේ දී හෝ විභාගයට ගෙන නොතිබිණි.

**2. CA/185/14 නඩුව**

හෝමියෝපති පනතේ 27(1) ඇ වගන්තිය යටතේ ලියා පදිංචිය ලබා ගැනීමට නොහැකි වූ වෛද්‍යවරුන්ගෙන් පනතේ මෙම වගන්තිය යටතේ ලියා පදිංචිය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවන ලෙසත් හෝමියෝපති පනතේ 27(5) වගන්තිය යටතේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචිය ලැබීමට සුදුසු වෛද්‍යවරුන් සඳහා විභාගයක් පවත්වන මෙන් නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පවරා ඇති නඩුව වසර අවසාන වන තෙක් අවසන්ව නොතිබුණි.

**දිසා අධිකරණය**

## 1. DC/14/318M- NEG/DC

2012/04/01 දිනෙන් පසුව මෙම නඩුව පවරන ලද දිනය දක්වා කිසිදු පුද්ගලයෙකු නීත්‍යානුකූලව හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරිවරයා සහ ලේකම්වරයා ලෙස ධූරයක් දරා නොමැති බවට සහ එම කාලය තුල කරන ලද සියලු ලියා පදිංචි කිරීම් වලංගු නොවන බවට ප්‍රකාශයක් ලබා ගැනිම සඳහා පවරා තිබූ මෙම නඩුව වර්ෂ අවසාන වන තෙක්ම අවසන් වී නොතිබිණි.

**මානව හිමිකම් කොමිෂන් සභාව**

## 1. HRC/3951/14

හෝමියෝපති වෛද්‍ය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝමියෝපති අතුරු පාලක කමිටුවට නොහැකි බව දක්වමින් වෛද්‍ය එස්. ඩී. පී. පෙරේරා විසින් පවරා ඇති නඩුවේ තීන්දුව වසර අවසන් වන තෙක්ම ලබා දී නොතිබුණි.

# 11. විගණන වාර්තාව

මෙම වසර තුළද හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ හෝමියෝපති අතුරු පාලක කමිටුවක් මගිනි. එබැවින්, වෛද්‍ය සභාවේ මූල්‍ය කටයුතු මෙහෙයවීම දේශීය වෛද්‍ය අංශය මගින් සිදු කරන ලදී. 2015 වසර සඳහා සකස් කෙරුණු අවසන් ගිණුම් ප්‍රකාශන එනම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය,ශේෂ පිරික්සුම මේ සමඟ අමුණා ඇත.

2015 වසරේ සකස් කරනු ලැබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව වසරේ කටයුතු මෙහෙය වනු ලැබීය. රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යාම, ජංගම සායන පැවැත්වීම, කාර්ය මණ්ඩල නඩත්තුව, සායන සඳහා ඖෂධ ලබා දීම, සායන සඳහා ගොඩනැඟිලි උපකරණ ලබා දීම යන සාමාන්‍ය ක්‍රියා පරිපාටියට අමතරව වසර තුළ සිදුකරනු ලැබූ විශේෂම කාර්ය වූයේ රජයේ හෝමියෝපති සායනයන්හි ස්ථාවර කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමය. උපාධිධාරී වෛද්‍යවරුන් සායන සඳහා ප්‍රථම වරට බඳවා ගැනීමට මේ වසරේ හැකියාව ලැබුණි. වසර 10 කට අධික කාලයක් සේවයේ යෙදී සිටි ඖෂධ සංයෝජකවරු ස්ථිර තනතුරු වල පිහිටුවන ලදී.

අමාත්‍යාංශය මගින් කෙටුම්පත් කර ඇති නව හෝමියෝපති පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආසන්නව පැවති හෙයින් හෝමියෝපති වෛද්‍ය සභාවක් ඉක්මණින් පත්කර ගැනීමේ අරමුණින්, එයට සහාය වන කාර්යයන් සම්පූර්ණ කිරීමේ අරමුණ සහිතව හෝමියෝපති අතුරු පාලක කමිටුව මෙම වසර තුළද සිය කාර්ය භාරය පවත්වා ගෙන යන ලදී.

විජිතා සෙනෙවිරත්න,

සභාපති,

හෝමියෝපති අතුරු පාලක කමිටුව.

# සුභාශිංසන

★ ★ ★ ★

ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය

ගරු නියෝජ්‍ය අමාත්‍ය

වෛද්‍ය සභා සාමාජිකයින්

ලේකම්තුමා සහ අතිරේක ලේකම්තුමියන්

හෝමියෝපති අතුරු පාලක කමිටුවේ සභාපතිතුමිය

අතුරු පාලක කමිටු සාමාජිකයන් / සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය

# 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

## අන්තර්ගතය


- 2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට පාදක ( 1 සිට 5 දක්වා) සටහන්
- 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට පාදක (1 සිට 5 දක්වා) සටහන්
- 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට පාදක ( 1 සිට 9 දක්වා) සටහන්
- 2015.12.31 දිනට ශේෂ පිරික්සුම
- 2015.12.31 දිනට ස්කන්ධ වෙනස්වීම් වාර්තාව

## හෝමියෝපති වෛද්‍ය සභාව
## 2015.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,218,074 | 2,124,884.00 |
| ජංගම නොවන වත්කම් | | | |
| පිරියත හා උපකරණ | 2 | 1,140,133 | 1,295,606.00 |
| ගොඩනැගිලි පුනරුත්ථාපන | | 953,828 | 953,828.00 |
| වෙනත් උපකරණ | | 1,450 | 1,450.00 |
| | | 2,095,411 | 2,250,884.00 |
| මුළු වත්කම් | | 4,313,485 | 4,375,768.00 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 3 | 192,156.00 | 526,036.00 |
| ජංගම නොවන බැරකම් | | | |
| මුළු බැරකම් | | 192,156.00 | 526,036.00 |
| ශුද්ධ වත්කම් | | 4,121,329.00 | **3,849,732.00** |
| | | 4,313,485.00 | 4,375,768.00 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | |
| ප්‍රාග්ධනය | | 2,562,144.00 | 2,562,144.00 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | | 1,572,047.00 | 1,572,047.00 |
| සමුච්චිත ඌනතාවය/අතිරික්තය | | (40,321.00) | (311,918.00) |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | | 27,459.00 | 27,459.00 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | 4,121,329.00 | **3,849,732.00** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ප්‍රධාන ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය |

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

ගීතාමනී සී. කරුණාරත්න
අතිරේක ලේකම් (සංවර්ධන)
(දේශීය වෛද්‍ය අංශය)
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක : 464, ටී.බී. ජයා මාවත

වෛද්‍ය ඒ. ජේ. එම්. මුතව්වර්
වෛද්‍ය නිලධාරී
රජයේ හෝමියෝපති රෝහල
වැලිසර.

ඩබ්ලිව්. ජී. ඩී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| | 2015 | 2014 |
|---|---|---|
| සටහන 1. | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,553,109 | 1,483,419.00 |
| ලංකා බැංකුව | 469,065 | 445,565.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900.00 |
| | 2,218,074 | 2,124,884.00 |
| සටහන 2. | | |
| **පිරියත හා උපකරණ** | | |
| පිරියත හා උපකරණ (ගත්මිල) | 2,323,316 | 2,323,316.00 |
| අඩුකළා: | | |
| සමුච්චිත ක්ෂය | 1,183,183 | 1,027,710.00 |
| ශුද්ධ අගය | 1,140,133 | 1,295,606.00 |
| සටහන 3. | | |
| ගෙවිය යුතු දෑ | | |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | | |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | | |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | 17,340 | 25,200.00 |
| ගෙවිය යුතු වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | | 16,000.00 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 145,616 | 125,616.00 |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | 5,964 | 7,245.00 |
| ගෙවිය යුතු විදුලිය | 716 | 624.00 |
| ගෙවිය යුතු ගමන් වියදම් | 1,567 | 4,001.00 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 1,800 | 1,607.00 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 3,766 | 11,324.00 |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අළුත් වැඩියා | | |
| ගෙවිය යුතු සංග්‍රහ වියදම් | | 796.00 |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | 14,487 | 22,213.00 |
| ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම් | 900 | 780.00 |
| ගෙවිය යුතු හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | 310,630.00 |
| | 192,156 | 526,036.00 |

**සටහන 4**

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)

අංක -1 ට අනුවය.

**සටහන 5**

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

ක්ෂය අනුපාතය 12%කි.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද, එය අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබේ.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද, අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

## හෝමියෝපති වෛද්‍ය සභාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| අයභාරය | | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | | 12,026,123 | 6,228,080.00 |
| වෙනත් අයභාර | 1 | 23,500 | 218,537.00 |
| බැංකු පොලී | | 75,751 | 85,056.00 |
| මුළු අයභාරය | | 12,125,374 | 6,531,673.00 |
| වියදම | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 2 | 9,565,203 | 5,153,573.00 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 3 | 57,770 | 81,029.00 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | | 155,473 | 176,673.00 |
| වෙනත් වියදම් | 4 | 2,069,270 | 1,284,230.00 |
| නීති ගාස්තු | | - | - |
| මූල්‍ය පිරිවැය (බැංකු ගාස්තු) | | 6,060 | 6,804.00 |
| මුළු වියදම | | 11,853,776 | 6,702,309.00 |
| කාලච්ඡේදය සඳහා ඌනතාවය /අතිරික්තය | | 271,598 | (170,636.00) |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

.................... ලේඛකාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාව

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

.................... සභාපති හෝමියෝපති වෛද්‍ය සභාව

ගීතාමනී සී. කරුණාරත්න
අතිරේක ලේකම් (සංවර්ධන)
(දේශීය වෛද්‍ය අංශය)
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක : 464, ටී.බී. ජයා මාවත
කොළඹ 10.

.................... කමිටු සාමාජික හෝමියෝපති වෛද්‍ය සභාව

.................... සකස් කළේ, ප්‍රධාන ගණකාධිකාරී දේශීය වෛද්‍ය අංශය

ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| සටහන 1 | 2015 | 2014 |
|---|---|---|
| **වෙනත් අයභාර** | | |
| වාර්ෂික ගාස්තු | 10,000 | 9,137.00 |
| විවිධ ලැබීම් | 13,500 | 13,500.00 |
| හෝමියෝපති විභාගය සඳහා වූ ගාස්තු | | 195,900.00 |
| | 23,500 | 218,537.00 |
| සටහන 2 | | |
| **වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ** | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,306,477 | 4,127,805.00 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 974,181 | 890,125.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 243,545 | 135,643.00 |
| පුහුණු කාර්මික සිසුන්ට දීමනා | 41,000 | |
| | 9,565,203 | 5,153,573.00 |
| සටහන 3 | | |
| **සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය** | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 10,363.00 | 24,581.00 |
| සංග්‍රහ වියදම් | 47,407.00 | 56,448.00 |
| | 57,770.00 | 81,029.00 |
| සටහන 4 | | |
| **වෙනත් වියදම්** | | |
| විවිධ වියදම් | 46,952 | 50,131.00 |
| ගමන් වියදම් | 20,660 | 24,815.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 144,000 | 151,020.00 |
| තැපැල් ගාස්තු | 10,585 | 6,050.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 108,000 | 116,000.00 |
| විගණන ගාස්තු | 20,000 | 40,000.00 |
| ජල ගාස්තු | 29,388 | 48,582.00 |
| විදුලිය ගාස්තු | 15,403 | 11,310.00 |
| දුරකථන ගාස්තු | 63,219 | 66,368.00 |
| මුද්‍රණ ගාස්තු | 62,720 | - |
| දැන්වීම් ගාස්තු | 80,919 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 11,183 | 5,556.00 |
| කාර්යාල උපකරණ හා වෙනත් උපකරණ | 52,067 | |
| දැයට කිරුළ වියදම් | | - |
| භාෂා පරිවර්තන ගාස්තු | 17,806 | 46,381.00 |
| වෛද්‍ය සායන සඳහා උපකරණ | 1,145,241 | 34,000.00 |
| වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම් | 20,275 | |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | - | 684,017.00 |
| ඉන්ධන වියදම් | 15,897 | |
| ශිෂ්‍යත්ව වියදම් | 198,890 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 6,065 | |
| | 2,069,270 | 1,284,230.00 |

සටහන 5

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)

අංක -1 ට අනුවය. එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම" යන පරිදි ඉදිරිපත් කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාව
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදානය | | 12,026,123 | 6,228,080.00 |
| බැංකු පොලී | | 75,751 | 85,056.00 |
| වෙනත් ලැබීම් | 1 | 23,500.00 | 218,537.00 |
| | | 12,125,374 | 6,531,673.00 |
| **ගෙවීම්** | | | |
| සේවක පිරිවැය | 2 | 9,572,761 | 5,221,587.00 |
| බැංකු පොලී (බැංකු ගාස්තු) | | 6,060 | 6,804.00 |
| වෙනත් ගෙවීම් | 3 | 2,453,362 | 1,006,493.00 |
| | | 12,032,183 | 6,234,884.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 93,191 | 296,789.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 0 | 597,324.00 |
| පිරියත හා උපකරණ මිලට ගැනීම | 4 | 0 | 597,324.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 5 | 93,191 | 296,789 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 6 | 2,124,884 | 1,828,095 |
| කාලපරිච්ඡේදය අවසානයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 7 | 2,218,075 | 2,124,884 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ................. | ................. | ................. | ................. |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ප්‍රධාන ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය අංශය |

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

ගීතාමණී සී. කරුණාරත්න
අතිරේක ලේකම් (සංවර්ධන)
(දේශීය වෛද්‍ය අංශය)
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අංක : 464, ටී.බී. ජයා මාවත
කොළඹ 10.

වෛද්‍ය ඒ. ජේ. එම්. මුතවර්
වෛද්‍ය නිලධාරි
රජයේ හෝමියෝපති රෝහල
වැලිසර.

ඩබ්. ඒ. සී. එස්. [illegible]
ප්‍රධාන ගණකාධිකාරී
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක 464, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

| | 2015 | 2014 |
|---|---|---|
| **සටහන 1 - අනෙකුත් ලැබීම්** | | |
| විවිධ ආදායම් | 13,500.00 | 9,137.00 |
| වාර්ෂික ගාස්තු | 10,000.00 | 13,500.00 |
| හෝමියෝපති විභාගය සඳහා වූ ගාස්තු | 0 | 195,900.00 |
| | 23,500.00 | 218,537.00 |
| **සටහන 2 - සේවක පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,314,035 | 4,175,636.00 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 974,181 | 907,675.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 243,545 | 138,276.00 |
| පුහුණු කාර්මික සිසුන්ට දීමනා | 41,000 | |
| | 9,572,761 | 5,221,587.00 |
| **සටහන 3 - අනෙකුත් ගෙවීම්** | | |
| විවිධ වියදම් | 46,952 | 50,131.00 |
| ලිපිද්‍රව්‍ය | 10,243 | 23,801.00 |
| ගමන් වියදම් | 23,093 | 22,867.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 160,200 | 142,020.00 |
| තැපැල් ගාස්තු | 10,585 | 6,050.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 124,000 | 120,000.00 |
| සංග්‍රහ වියදම් | 48,203 | 55,652.00 |
| ජල ගාස්තු | 29,195 | 57,131.00 |
| විදුලිය ගාස්තු | 15,312 | 11,926.00 |
| දුරකථන ගාස්තු | 64,500 | 63,060.00 |
| මුද්‍රණ ගාස්තු | 62,720 | - |
| දැන්වීම් ගාස්තු | 80,919 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 11,182 | 22,300.00 |
| දැයට කිරුළ වියදම් | | - |
| භාෂා පරිවර්තන ගාස්තු | 25,532 | 24,168.00 |
| නීති වියදම් | | - |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | 373,387.00 |
| වෛද්‍ය සායන සඳහා උපකරණ | 1,145,241 | 34,000.00 |
| කාර්යාල උපකරණ හා වෙනත් උපකරණ | 52,067 | |
| වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම් | 11,936 | |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | 310,630 | |
| ඉන්ධන වියදම් | 15,897 | |
| ශිෂ්‍යත්ව වියදම් | 198,890 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 6,065 | |
| | 2,453,362 | 1,006,493.00 |

| | | |
|---|---|---|
| සටහන 4 - පිරියත හා උපකරණ මිලට ගැනීම | | |
| පරිගණකය (එච්පී) | | 119,900.00 |
| කණ,උගුර සහ නාසය පරීක්ෂා කිරීමේ උපකරණ | | 140,000.00 |
| බර කිරන තරාදි | | 4,000.00 |
| සීලිං විදුලි පංකා | | 24,430.00 |
| විදුලි පංකා (Pedestal) | | 33,250.00 |
| පුටු - කැරකෙන | | 37,632.00 |
| ඇඳිපුටු (Fabric Cushion) | | 159,712.00 |
| වානේ අල්මාරි | | 43,680.00 |
| ඇඳිපුටු (ප්ලාස්ටික්) | | 15,120.00 |
| තේක්ක මේස අඩි 5*3 (ලාච්චු 02) | | 19,600.00 |
| | 0 | 597,324.00 |
| සටහන 5 - මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | |
| වර්ෂය අවසාන මුදල් ශේෂය | 2,022,175 | 2,124,884.00 |
| වර්ෂය ආරම්භක මුදල් ශේෂය | 1,928,984 | 1,828,095.00 |
| | 93,191.00 | 296,789.00 |
| සටහන 6 - කාලපරිච්ඡේදය ආරම්භයේවූ මුදල් හා මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,483,419 | 1,405,167.00 |
| ලංකා බැංකුව | 445,565 | 422,928.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | |
| | 2,124,884 | 1,828,095.00 |
| සටහන 7 - කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,553,110 | 1,483,419.00 |
| ලංකා බැංකුව | 469,065 | 445,565.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900 | 195,900.00 |
| | 2,218,075 | 2,124,884.00 |
| | 93,191 | 296,789.00 |
| සටහන 8 | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/(ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමඟ සැසඳීම | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/(ඌනතාවය) | 271,598 | (170,636.00) |
| මුදල් නොවන වෙනස් වීම් | | |
| ක්ෂය වීම් | 155,473 | 176,673.00 |
| සටහන 9 | | |
| ගෙවිය යුතු වැය වැඩිවීම | (333,880) | 290,752.00 |
| පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ වාර්ෂික වෙනස් වීම් | 0 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් | 93,191.00 | 296,789.00 |

**සටහන 9 - ගෙවිය යුතු වැය වැඩිවීම**

| | 2014 සහ 2015 වර්ෂයන් සැසඳීම | | |
|---|---|---|---|
| | වාර්ෂික අඩුවීම | වාර්ෂික වැඩිවීම | ශුද්ධ වෙනස් වීම (+) / (-) |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | | | |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | | | |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | 7,860 | | |
| ගෙවිය යුතු වෛද්‍ය සහා රුස්වීම් ගාස්තු | 16,000 | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | 20,000 | |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | 1,281 | | |
| ගෙවිය යුතු විදුලිය | | 92 | |
| ගෙවිය යුතු ගමන් වියදම් | 2,434 | | |
| ගෙවිය යුතු ජල ගාස්තු | | 193 | |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 7,558 | | |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අළුත් වැඩියා | | | |
| ගෙවිය යුතු සංග්‍රහ වියදම් | 796 | | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | 7,726 | | |
| ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම් | | 120 | |
| ගෙවිය යුතු හෝමියෝපති විභාගය සඳහා වූ වැය | 310,630 | | |
| | | | |
| | **354,285** | **20,405** | **333,880** |

# හෝමියෝපති වෛද්‍ය සභාව

| | 2015.12.31 දිනට ශේෂ පිරික්සුම | |
|---|---|---|
| විස්තරය | හර (රුපියල්) | බැර (රුපියල්) |
| තැපැල් ගාස්තු | 10,586 | |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 108,000 | |
| මුද්‍රණ ගාස්තු | 62,720 | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 8,347,477 | |
| උපචිත කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 3,766 |
| සේවක අර්ථ සාධක අරමුදල | 974,181 | |
| උපචිත සේවක අර්ථ සාධක අරමුදල | | |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 243,545 | |
| අරමුදල | | |
| දුරකතන ගාස්තු | 63,219 | 5,964 |
| උපචිත දුරකතන ගාස්තු | | |
| විවිධ වියදම් | 46,952 | |
| ගමන් වියදම් | 20,660 | |
| උපචිත ගමන් වියදම් | | 1,567 |
| කාර්යාල උපකරණ | 53,517 | |
| සායන සඳහා වූ අනෙකුත් වැය | 20,275 | |
| උපචිත සායන සඳහා වූ අනෙකුත් වැය | | 8,340 |
| සායන සඳහා උපකරණ | 1,145,241 | |
| කාර්යාල උපකරණ අලුත්වැඩියා | 11,182 | |
| ජල ගාස්තු | 29,388 | |
| උපචිත ජල ගාස්තු | | 1,800 |
| විදුලි ගාස්තු | 15,404 | |
| උපචිත විදුලි ගාස්තු | | 716 |
| ඉන්ධන වියදම් | 15,897 | |
| විගණන ගාස්තු | 20,000 | |
| විගණන ගාස්තු වෙන්කිරීම | | 145,616 |
| බැංකු ගාස්තු | 6,060 | |
| රජයේ ප්‍රතිපාදන - පුනරාවර්තන | | 12,026,123 |
| රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | 1,572,047 |
| බෙහෙත් ශාලා ගාස්තු | 144,000 | |
| උපචිත බෙහෙත් ශාලා ගාස්තු | | 9,000 |
| වාර්ෂික ක්ෂය කිරීම් | 155,473 | |
| ක්ෂය වෙනිකිරීමේ ගිණුම | | 1,183,183 |
| වෙන්කල අරමුදල් ගිණුම | | |
| වාර්ෂික ගාස්තු | | 5,100 |

| | 2015.12.31 දිනට ශේෂ පිරික්සුම | |
|---|---|---|
| බැංකු පොලී ආදායම් ගාස්තු | | 75,751 |
| විවිධ ආදායම් | | 18,400 |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | | 27,459 |
| මුදල් ශේෂය - කොමර්ෂල් බැංකුව | 1,553,110 | |
| මුදල් ශේෂය - ලංකා බැංකුව | 469,065 | |
| මුදල් ශේෂය - ලංකා බැංකුව රාජගිරිය | 195,900 | |
| සුළු මුදල් | | |
| සංග්‍රහ වියදම් | 47,407 | |
| උපචිත සංග්‍රහ වියදම් | | - |
| ලිපිද්‍රව්‍ය වියදම් | 10,363 | |
| උපචිත ලිපිද්‍රව්‍ය වියදම් | | 900 |
| උපචිත වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 6,065 | |
| දැන්වීම් ගාස්තු | 80,919 | |
| හෝමියෝපති විභාග ගාස්තු | | |
| උපචිත හෝමියෝපති විභාග ගාස්තු | | |
| භාෂා පරිවර්තන ගාස්තු | 17,806 | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | 14,487.00 |
| ශිෂ්‍යත්ව වියදම් | 198,889 | |
| උපචිත භාෂා පරිවර්තන ගාස්තු | | |
| උපචිත කාර්යාල උපකරණ අලුත්වැඩියා | | |
| නීති ගාස්තු | | |
| දැයට කිරුළ වැය | | |
| දේපල පිරියත හා උපකරණ | 2,323,316 | |
| ගොඩනැගිලි පුනරුත්ථාපන වැය | 953,828 | |
| ප්‍රාග්ධන ගිණුම | | 2,562,144 |
| 2014.12.31 දිනට සමුච්චිත ඌනතා ගිණුමේ ශේෂය | 311,918 | |
| **එකතුව** | **17,662,363** | **17,662,363** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

.................... .................... .................... ....................

කරුණාරත්න
අතිරේක ලේකම් (සංවර්ධන)

කමිටු සාමාජික
හෝමියෝපති

ඩබ්. වී. සී. එස්. ප්‍රියදර්ශනී
සකස් කළේ

| ස්කන්ධය වෙනස්වීම් | සංචිත<br>රු. |
|---|---:|
| ආරම්භක ශේෂය (2015.01.01 දිනට) | 2,562,144.00 |
| | |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | 1,572,047.00 |
| | |
| පෙර වර්ෂ ගැලපුම් | 27,459.00 |
| | |
| සමුච්චිත ඌනතාවය / අතිරික්තය | (40,321.00) |
| | |
| වර්ෂය අවසානයේ ශේෂය (2015.12.31 දිනට) | 4,121,329.00 |
| | |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එච්එස්එම්/බී/එච්එම්සී/1/15/04 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2016 නොවැම්බර් 23 දින.

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

**හෝමියෝපති වෛද්‍ය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2016 නොවැම්බර් 09 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.42,475 ක් වූ වෛද්‍ය උපකරණ 5 ක් ප්‍රාග්ධනීත කිරීම වෙනුවට පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුතු 18 දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්ය මණ්ඩලය වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 2.2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395 | ජංගම ගිණුම් දෙක වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 (1) | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 හෝ එකී දිනට ආසන්නව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ යුතු වුවද 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 ජුලි 31 වන විටත් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.271,598 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.170,636 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.442,234 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.5,798,043 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.74,938 ක අතිරික්තයක් වූ අතර 2012, 2013 හා 2014 වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.29,305 ක, රු.111,977 ක හා රු.170,636 ක ඌනතාවයන් විය. 2015 වර්ෂයේදී එය රු.271,598 ක අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැළකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.4,544,910 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.9,951,274 ක් දක්වා සියයට 2 සිට සියයට 111 අතර උච්චාවචනයක් සහිතව වර්ධනයවී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

වෛද්‍ය සභාවේ සේවය කළ කම්කරුවෙකු සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රු.3,000,000 ක වන්දි ඉල්ලා එක් නඩුවක් සහ තාවකාලික වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අහෝසි කිරීම, ඔවුන්ගේ විභාග පැවැත්වීමට ඉඩ නොදීම හා අතුරු පාලක කමිටුව අහෝසි කිරීම යනාදී කරුණු මුල් කරගෙන අදාළ පාර්ශවයන් විසින් නඩු 05 ක් අධිකරණවල ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1970 අංක 7 දරන හෝමියෝපති පනත ප්‍රකාරව

- හෝමියෝපති ක්‍රමයට අනුව වෛද්‍යකර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, පාලනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ධෛර්යමත් කිරීම.
- හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම හා එය නඩත්තු කර ගෙන යාම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව රෝග පිළිබඳ අන්වේශණයට සහ මහජන සෞඛ්‍ය වර්ධනයට පියවර ගැනීම සංවර්ධනය කිරීම හෝ එය ධෛර්යමත් කිරීම.
- හෝමියෝපති ආයතන ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සහ හෝමියෝපති ඖෂධ වර්ග, බෙහෙත් සහ වෙනත් ඖෂධ සංයෝග නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදාහැරීම ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම සභාවේ අරමුණු ලෙස දක්වා තිබුණි.

සමාලෝචිත වර්ෂය තුලදී ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදු කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත අරමුණු වලින් හෝමියෝපති ක්‍රමවේදයට අනුව වෛද්‍ය කර්මයෙහි යෙදීම ක්‍රමවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(i) ජංගම සායන 21 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ඉන් සායන 14 ක් ම පවත්වා නොතිබුණි.

(ii) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දැනුවත් කිරීමේ පැසැල් වැඩසටහන් 03 ක් පැවැත්වීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සියලුම ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් ලබාදීම සඳහා රූපවාහිනී හා ගුවන් විදුලි සාකච්ඡා 05 ක් සංවිධානය කිරීම Web Home Page එකක් ආරම්භ කිරීම යන සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සේවය සහ අත්දැකීම් ඇගයීමේ වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඉන් එක් වැඩමුළුවක් පමණක් පවත්වා තිබුණි.

(iv) හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම, රෙගුලාසි සම්පාදනය කිරීම හා ගැසට් කිරීම, හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය පිළිබඳ වෙළඳපොල සුලභතාවය තහවුරු කිරීම සඳහා අතුරු නීති සම්පාදනය කිරීම, හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම හා ඖෂධ තොග ආනයනය සහ බෙදාහැරීමට සැළසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒ සම්බන්ධයෙන්වූ කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණද, එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබීම නිසා 2016 නොවැම්බර් 01 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වසර 05 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2012 ජනවාරි 05 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදි වෛද්‍ය සායන 7 සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමටද, 2013 අගෝස්තු 29 දින පැවති අතුරු පාලක කමිටු රැස්වීමේදී නව සායන 14 ක් සඳහා තනතුරු අනුමත කරවා ගැනීමට හා හෝමියෝපති අධ්‍යාපන ආයතනය පිළිබඳ රීතින් හා අවශ්‍යතා ගැසට් කිරීමටද, 2014 ජනවාරි 08 දින පැවති අතුරු කමිටු රැස්වීමේදී හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා

බෙදාහැරීම පිළිබඳව 1981 හෝමියෝපති නියෝග තවදුරටත් පුළුල් කරමින් ප්‍රමාණවත් පරිදි නීති හා රෙගුලාසි සකස් කිරීමටද තීරණය කර තිබුණු නමුත් විගණිත දිනයවූ 2016 ජූලි 04 දින වනවිටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මුදල් ගෙවා නොමැති වෛද්‍යවරු හඳුනාගෙන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 ආර්ථික නොවන ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවත්වාගෙන යනු ලබන සායන 7 න් වාර්ෂිකව ප්‍රතිකාර ගනු ලබන රෝගීන්ගේ සාමාන්‍යය 55,000 ක් පමණ වන අතර ඔවුන් සඳහා වාර්ෂික සාමාන්‍ය පරිභෝජනය ඩප්පි 220,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.1,145,241 ක් වැය කර ඖෂධ බහාලුම් (ඩප්පි) කුඩා හා විශාල ප්‍රමාණයේ ඒකක 1,764,000 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සභාව සතුව ප්‍රමාණවත් හා ප්‍රමිතියෙන් යුත් ගබඩා පහසුකම් නොතිබියදී වර්ෂ 8 කට වැඩි කාලයකට ප්‍රමාණවත් තොගයක් මිලදී ගැනීම සඳහා විශාල මුදලක් වැය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් වෙත අළෙවි කිරීමේ අපේක්ෂාවෙන් රු.62,000 ක් වැය කර වෛද්‍ය සහතික පොත් 500 ක් මිලදී ගෙන තිබූ නමුත් 2016 ජූලි වන විටත් පොත් 13 ක් පමණක් අළෙවි කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

----------------------

හෝමියෝපති වෛද්‍ය සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කටයුතු සිදු කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

වෛද්‍ය සභාව සතුව වාහනයක් නොතිබියදී වාහන නඩත්තු වියදම් වෙනුවෙන් රු.500,000 ක් සහ ඉන්ධන වෙනුවෙන් රු.180,000 ක් අයවැය මගින් වෙන්කර තිබූ අතර අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සළසා නොතිබුණු විෂයයන් 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,974,774 ක් වැයකර තිබුණි. තවද අයවැය ලේඛනයට අනුව වියදම් අයිතම 13 ක ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 50 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

වර්තමාන තතත්වයට ගැලපෙන පරිදි හෝමියෝපති වෛද්‍ය සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළයුතු බවට 2010 සැප්තැම්බර් 15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද හෝමියෝපති වෛද්‍ය සභාව පත්කර නොතිබීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. මූලික උපයෝගී පොත් හා ලෙජර් ගිණුම් සහිතව ගිණුම් කටයුතු පවත්වා ගෙන යාම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.